# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර)

(අදාළ විෂයය ක්ෂේත්‍ර පහත සඳහන් වේ)

| කනතුර | රැකියා විස්තරය |
|---|---|
| **සහකාර අධ්‍යක්ෂ (ජාල සහ නව සේවා)** | 1. විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ආරවුල් සම්බන්ධීකරණය කිරීම හා නිරාකරණය කිරීම..<br>2. විදුලි සංදේශ යටිතල පහසුකම් පිළිබඳ දත්ත සමුදාය පවත්වා ගැනීම.<br>3. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා සම්ප්‍රේෂණ සැලසුම් අනුමත කිරීම.<br>4. යටිතල පහසුකම් හවුලේ පරිහරණය කිරීමේ දී ක්‍රියාකරුවන්ට සහාය වීම.<br>5. විදුලි සංදේශ අයිතම ආනයනය සහ අපනයනය පිළිබඳ මාදිලි අනුමැති සහතික සහ නිෂ්කාශන සහතික පරීක්ෂා කිරීම, ඇගයීම සහ නිකුත් කිරීම.<br>6. අන්තර් ක්‍රියාකාරීත්වය සහ අන්තර් සම්බන්ධතා ජාලය පිරික්සීම.<br>7. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශය සඳහා අංකන ක්‍රමය ක්‍රියාත්මක කිරීම.<br>8. ගුවන්විදුලි සම්ප්‍රේෂණය, කුළුණු, මූලික මධ්‍යස්ථාන ස්ථාපනයන් සහ විද්‍යුත් චුම්භක විකිරණ බලපෑම් පිළිබඳ මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br>9. රටේ පහත සඳහන් ක්ෂේත්‍රවල නව විදුලි සංදේශ පහසුකම් අධීක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම<br>I. නව පරම්පරාවේ ජාල සහ ආරක්ෂක කරුණු ආශ්‍රිත ජාල<br>ii. අන්තර්ජාල යෙදුම් ( IP) හඬ සහ අන්තර්ජාලය පදනම් කරගත් සේවා ජාල<br>iii. නිෂ්පාදන සහ තාක්ෂණික අනුකූලතාව<br>iv. තොරතුරු තාක්ෂණය සහ වෙබ් අඩවි<br>v. නව තාක්ෂණික ප්‍රමිතීන්<br>vi. සේවා අන්තර් ක්‍රියාකාරීත්වය<br>10. විදුලි සංදේශ පර්යන්ත උපකරණවල පිරිවිතරයන් සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.<br>11. නව විදුලි සංදේශ උපකරණ සහ උපාංග සම්බන්ධයෙන් තාක්ෂණික පරීක්ෂණ පැවැත්වීම. |
| **සහකාර අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සබඳතා සහ ප්‍රතිපත්ති)** | 01. ශීඝ්‍රයෙන් වෙනස් වන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අවශ්‍යතා හා නව ප්‍රවණතා අනුව ජාතික විදුලි සංදේශ ප්‍රතිපත්ති සකස් කිරීම.<br>02. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය හා අනෙකුත් ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.<br>03. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය( ITU) , ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) වැනි ජාත්‍යන්තර සංවිධාන හා ජාත්‍යන්තර ගිවිසුම් හෝ සංවිධානයේ ව්‍යවස්ථාවකට බැඳී සිටීමට එකඟ වන විධිමත් නීතිමය ක්‍රියාවලි සම්බන්ධ කරුණු සඳහා රජයේ අනුමැතිය ලබාගැනීම.<br>04. විදුලි සංදේශ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රඥප්ති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.<br>05. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අවශ්‍යතා හා මාර්ගෝපදේශ අදාළ අංශ වෙත බෙදා හැරීම.<br>06. විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති යෝජනා සංවර්ධනය කිරීම.<br>07. උපදේශක කමිටු රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.<br>08. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තාක්ෂණික මෘදුකාංග සහ ගුවන්විදුලි රෙගුලාසි අර්ථකථනය කිරීම.<br>09. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සමඟ තාක්ෂණික ව්‍යාපෘති සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |
| **සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන )** | 1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මානව සම්පත් සැලසුම්කරණ කටයුතු සම්පූර්ණයෙන්ම පරිපාලනය කිරීම.<br>2. සේවක සංඛ්‍යාව, වැටුප්, පත්වීම්, උසස්වීම්, මාරුවීම්, විනය පාලන කටයුතු සහ සේවයෙන් ඉවත් කිරීම් සම්බන්ධ සියලු පරිපාලන කටයුතු මෙහෙයවීම. .<br>3. බඳවා ගැනීමේ විභාග සහ සම්මුඛ පරීක්ෂණ, කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනෙකුත් පරීක්ෂණ පැවැත්වීම සඳහා වගකිව යුතු වීම.<br>4.කාර්ය මණ්ඩල පුහුණු සැලසුම් සකස් කිරීම, පුහුණු ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සහ උසස් පුහුණු කමිටු රැස්වීම් ඇතුළු සියලුම පුහුණු සම්බන්ධ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.<br>5. කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු මෙහෙයවීම. |
| **සහකාර අධ්‍යක්ෂ (සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන )** | 01. පහත සඳහන් ක්ෂේත්‍රයන්හී ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.<br>මයික්‍රෝවේව් සබැඳි ඇතුළුව රැහැන් රහිත විදුලි සංදේශ සේවා<br>ඇනලොග් සහ ඩයලොග් රූපවාහිනී සේවා<br>ගුවන්විදුලි විකාශනය සහ චන්ද්‍රිකා සේවා<br>චන්ද්‍රිකා සහ ආධුනික ගුවන්විදුලි සේවා<br>ගුවන් සහ සමුද්‍රීය සේවා<br>02. පිරික්සුම් පාලන මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම<br>03. ගුවන්විදුලි සංඛ්‍යාත පැවරීමට අදාළ ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ සැලසුම් සහ වාර්තා සකස් කිරීම.<br>04. අවහිරතා සම්බන්ධ පැමිණිලි සලකා බැලීම සහ ඒවා අවම කිරීමේ කටයුතු වල නිරත වීම.<br>05. බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ ඉන්වොයිසි කිරීම. |
| **සහකාර අධ්‍යක්ෂ (නීති)** | 1. විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ සියලුම නීතිමය කටයුතු මෙහෙයවිම.<br>2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් උසාවි සහ විනිශ්චය සභාවලදී ගොනු කරන ලද සහ විරුද්ධව නඩු සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු කිරීම සහ අවශ්‍ය නීතිමය කටයුතුවලට සහභාගී වීම.<br>3. නීති බලධාරීන්ගේ අවශ්‍යතා අනුව අදාළ නිරීක්ෂණ සහ ලේඛන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.<br>4. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් නීතිමය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.<br>5.විදුලි සංදේශ පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් නීති, රෙගුලාසි, බලපත්‍ර, කොන්දේසි සහ නියෝග කෙටුම්පත් කිරීමත්, උපදෙස් සහ තීරණ සකස් කිරීමත් සිදු කිරීම.<br>6. විදුලි සංදේශ පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා නීතිමය සහාය ලබා දීම.<br>7. ප්‍රසිද්ධ මහජන සාක්ෂි විභාග පැවැත්වීම පිණිස නීතිමය සහාය ලබාදිම |

**අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් , වගුව 2 හි සඳහන් ක්ෂේත්‍රයට අදාළ උපාධියක්.

පිළිගත් වෘත්තීය ආයතනයක, වගුව 2 හි සඳහන් ක්ෂේත්‍රයට අදාළ ආශ්‍රිත සාමාජිකත්වය.

**සහ**

**අවශ්‍ය පළපුරුද්ද:**

වගුව 2 හි සඳහන් අදාළ ක්ෂේත්‍රයේ , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක, ස්ථිර පදනම මත අවම වශයෙන් වසර 03ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

**හෝ**

වගුව 2 හි සඳහන් අදාළ ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මෙහෙයුම්/ව්‍යාප්ති හා බලාත්මක කිරීමේ කාණ්ඩය (TRC-4-1, TRC-5-1, TRC-5-2) හෝ ආශ්‍රිත නිලධාරී කාණ්ඩයට (TRC-6-1) අයත් තනතුරක ස්ථිර පදනම මත අවම වශයෙන් වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**හෝ**

2 වන වගුවේ සඳහන් අදාළ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මෙහෙයුම්, කළමනාකරණ සහකාර කාණ්ඩයේ (TRC-7-1, TRC-8-1, TRC-8-2) තනතුරක ස්ථිර පදනම මත අවම වශයෙන් අවුරුදු 12 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම්**

සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ට කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි දත්ත සමුදා කළමනාකරණය සහ සම්මත මෘදුකාංග පැකේජ පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු වීම .

සහ

කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂා පිළිබඳ විශිෂ්ට සන්නිවේදන කුසලතාවය (ලිඛිත සහ වාචික).

**වැටුප** : සහකාර අධ්‍යක්ෂ TRC 2.2 - 157,652 - (10x3519)-(10x4223)-(10x5631) -291,382

බඳවා ගැනීමේ පටිපාටිය - ලිඛිත තරඟ විභාගය සහ ඉන් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි

<u>ලිඛිත විභාගයේ විෂයයන්</u>

අ) සාමාන්‍ය බුද්ධිය - පැය 1

ආ) විෂය දැනුම (තනතුරට අදාළ) - පැය 2

ඇ) කළමනාකරණ කුසලතා - පැය 2

කරුණාකර වැඩිදුර විස්තර සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පුස්තකාලයේ තබා ඇති සේවක බඳවා ගැනීම් පටිපාටිය (SOR) පරිශීලනය කරන්න

වගුව 1

| තනතුරු | අධ්‍යාපන සුදුසුකම් සඳහා ක්ෂේත්‍ර | වෘත්තීය සුදුසුකම් සඳහා ක්ෂේත්‍ර | ක්ෂේත්‍රයේ පළපුරුද්ද: |
|---|---|---|---|
| **සහකාර අධ්‍යක්ෂ (ජාල සහ නව සේවා)** | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය | අයදුම් කරන තනතුරට අදාළ රැකියා විස්තරයේ සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට සහය ලබා දීම. |
| **සහකාර අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සබඳතා සහ ප්‍රතිපත්ති)** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය | ජාත්‍යන්තර සබඳතා හෝ මහජන ප්‍රතිපත්ති හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි ඉංජිනේරු හෝ තොරතුරු තාක්ෂණ හෝ වාණිජ්‍ය හෝ ආර්ථික විද්‍යාව | |
| **සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ මානව සම්පත් සංවර්ධනය හෝ ව්‍යාපාර පරිපාලනය | |
| **සහකාර අධ්‍යක්ෂ (සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන )** | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය | |
| **සහකාර අධ්‍යක්ෂ (නීති)** | නීතිය | නීතිඥ | නීතිඥයකුවීම |

වගුව 02

**පොදු කොන්දේසි :**

I. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් කාණ්ඩයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තිය ප්‍රකාරව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.

II. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.

III. අයදුම්පත් භාරගැනීම සඳහා නියම කර ඇති අවසන් දිනයට පෙර, ඉහත සඳහන් කර ඇති සියලුම අවශ්‍ය සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබේ නම් පමණක්, ඔහු/ඇය මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් අයෙකු ලෙස සැලකේ.

IV. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අයදුම් කිරීමේ ක්‍රමය:**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික කළ පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පෙර පාලන හා ආයතනික කටයුතු අංශයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.06.01 වේ.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය ( අභ්‍යන්තර )**

1.සම්පූර්ණ නම :…………………………………………………………………………

2. මුලකුරු සමඟ නම : …………………………………………………………………………

3. ලිපිනය : …………………………………………………………………………

4. ස්ත්‍රී/ පුරුෂ භාවය …………………………………………………………………………

5. උපන් දිනය :………………………. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :………………….

6. ජාතික හැඳුනුම්පත් අංකය : …………………………………………………………………………

7. දුරකථන අංකය : ……………………………. විද්‍යුත් තැපැල් ලිපිනය :……………………………..

8.අධ්‍යාපන සුදුසුකම් : ……………………………………………………………………

1. වෘත්තීය සුදුසුකම් : ……………………………………………………………………

2. සේවා පළපුරුද්ද : …………………………………………………………………………

3. අමුණා ඇති සහතික පිටපත් 1 …………………………………………………………………………
   2…………………………………………………………………………
   3…………………………………………………………………………
   4…………………………………………………………………………

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි .

……………………………. ……………………………..

දිනය : අයදුම්කරුගේ අත්සන

අංශ ප්‍රධානිගේ නිර්දේශය :

ඉහත අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරනු ලැබේ.

දිනය : ……………………………………. අත්සන : ………………………..

නම : …………………………….

තනතුර :……………………….